ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය
டிஜிட்டல் பொருளாதார அமைச்சு
MINISTRY OF DIGITAL ECONOMY

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
ஆட்களைப் பதிவு செய்யும் திணைக்களம்
DEPARTMENT FOR REGISTRATION OF PERSONS

10 වන මහල, සුහුරුපාය, ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල.
10 ஆம் மாடி,சுஹுருபாய, ஸ்ரீ சுபூத்திபுர வீதி, பத்தரமுல்லை.
10th Floor, Suhurupaya, Sri Subhuthipura rd, Battaramulla.

මගේ අංකය / எனது இல. / My Ref. } DRP/OP/10/15/01

ඔබේ අංකය / உமது இல. / Your Ref. }

දිනය / திகதி / Date } 2026.02.27

"විශ්වසනීය පුද්ගල අනන්‍යතාව හැඳුනුම්පතයි" "அடையாள அட்டை - நம்பகத்தன்மையான தனிநபர் அடையாளம்" "Identity Card, the Trusted Personal Identity"

දෙපාර්තමේන්තු කාර්යය මණ්ඩලයේ සියලුම නිලධාරීන් වෙත,

**ජාතික හැඳුනුම්පතට ඉංග්‍රීසි භාෂාවෙන් ලිපිනය හා උපන් ස්ථානය ඇතුලත් කිරීම.**

ජාතික හැඳුනුම්පතට ඉංග්‍රීසි භාෂාවෙන් ලිපිනය ඇතුලත් කිරීමේදී ඉල්ලුම්කරු ඉල්ලා ඇති ලිපිනය හා ව්‍යවහාරයේ පිළිගත් ඉංග්‍රීසි භාෂාව සහිත ගම්/නගර/වීදි ආදිය ජාතික හැඳුනුම්පතට ඇතුලත් කිරීමේදී විවිධ ගැටළු මතු වී ඇති බවට නිරීක්ෂණය වී ඇති බැවින් 2026.03.01 දින සිට පහත උපදෙස් පරිදි කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

I. ජාතික හැඳුනුම්පත ලබා ගැනීම සඳහා ඉල්ලුම්පත් යොමු කිරීමේදී ඉල්ලුම්කරු විසින් ඉල්ලුම්පතෙහි සඳහන් කර ඇති ලිපිනය හා උපන් ස්ථානය ඉංග්‍රීසි භාෂාවෙන් නිවැරදිව ඇතුලත් කර ඇත්දැයි ඉල්ලුම්පත භාරගැනීමේදී පරීක්ෂා කළ යුතු අතර එහිදී පවතින සාමාන්‍ය ක්‍රමයට වඩා ඉංග්‍රීසි භාෂාවෙන් ලියා ඇති අක්ෂරවල වෙනසක් පවතී නම් ඒ පිළිබඳ ඉල්ලුම්කරු වෙතින් විමසා නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතුය.

II. ලිපිනය ලිවීමේදී අවසානයට ඇති කොටස ඉංග්‍රීසි භාෂාවෙන් නිවැරදිව සටහන් කර නොමැති බවට නිරීක්ෂණය වන අවස්ථාවල Google Map හි සඳහන් පරිදි ඉල්ලුම්පතට ඇතුලත් කිරීමට කටයුතු කළ යුතු අතර අනෙකුත් කොටස් ඉල්ලුම්කරු දෝෂ සහගත ලෙස ඉල්ලා ඇති විට උපලේඛණවල පරිදි එම ගම්/නගර/වීදි ආදිය ලබා දීමට කටයුතු කළ යුතුය.

02. ඉහත සඳහන් පරිදි කටයුතු කිරීමේදී, ඉල්ලුම්කරු එකඟ නොවන අවස්ථාවල මාණ්ඩලික නිලධාරියෙකුගේ උපදෙස් සඳහා ඉල්ලුම්පත යොමු කළ යුතු වේ. එබැවින්, වඩාත් නිවැරදි ජාතික හැඳුනුම්පතක් ඉල්ලුම්කරු වෙත ලබා දීමට කටයුතු කිරීම අපගේ වගකීමක් වන බැවින් ඉහත උපදෙස් අනුව ඉදිරි කටයුතු සිදු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

මේ සම්බන්ධයෙන් ඔබ ලබාදෙන සහයෝගය ඉතා අගය කරමි.

**එම්.එස්.පී.සූරියප්පෙරුම**
පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් (වැ.බ)

පිටපත් :

01. ලේකම්, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස
02. සියළුම දිස්ත්‍රික් ලේකම්වරු - කරු.දැ.ගැ.ස
03. සියළුම ප්‍රාදේශීය ලේකම්වරු - කරු.දැ.ගැ.ස හා ග්‍රාම නිලධාරීන් සහ දෙපා.අනුයුක්ත සියළුම සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීම සඳහා

දුරකථන / தொலைபேசி / Telephone } (011) 5226100
ෆැක්ස් / பெக்ஸ் / Fax } (011) 2862198
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail } info@drp.lk
වෙබ් / இணையதளம் / Web } www.drp.gov.lk